# සීමාසහිත ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය අයදුම්පත් කැඳවීම

සීමාසහිත ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතියේ පුප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 06/2022 චක්‍රලේඛ අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සියලුම අයදුම්පත් **2024.02.06** දින හෝ එදිනට පෙර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර "ගරු සභාපති, සීමාසහිත ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි, හැටන් පාර, ගිනිගත්හේන" යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉල්ලුම්පත සමග අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පතක්, අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ලබාගත් චරිත සහතික 02, පදිංචිය තහවුරු කිරීම සහ ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපත සහ හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය.)

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුක්ත අයෙකු නම්, සමිතිය මගින් අයදුම්පතක් යොමු කළ යුතුවේ.

**මාණ්ඩලික මට්ටම II -**

**අභ්‍යන්තර විගණක II සහ I**

| | |
|---|---|
| වැ.පි. අංක | - E.L 03.01 |
| වැ. පරිමාණය | - 28500-570X10-855X10-1140X10 = 54150/= |
| වයස් සීමාව | - 18-45 |
| පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | - 01 |

**සුදුසුකම්**

(අ) ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පොත් තබන්නා තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම කළමනාකරු (ව්‍යාපෘති) කළමනාකරු 1 (ස.ණ.ස සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය / විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමග ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක පොත් තබන්නා තනතුරක හෝ කළමනාකරු - I (ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණය / කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වාණිජ කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වී තිබීම.

(ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර II (Charted Level II)/ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II (A.A.T Level II) සමත් වීම.

**ද්විතීයික මට්ටම -**

**ලේකම් II සහ I තනතුර**

| | |
|---|---|
| වැ.ප. අංක | - S.L04.02 |
| වැ. පරිමාණය | - 27000-540X10-810X10-1080X10-51300/= |
| වයස් සීමාව | - 18 - 45 |
| පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | - 01 |

**සුදුසුකම්**

(අ) සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු - I (ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක / ණය සහකාර තනතුරක වසර 10 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) මාස 09 ට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණ / ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාව සමත්වීම සමග සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / (ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු - I (ස.ණ.ස සමිති වෙනත් මූල්‍ය ආයතන) වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ණය සහකාර තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ඇ) අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 04කින් සමත්වීම. (පැරණි නිර්දේශය) / විෂයයන් 01 කට සම්මාන සහිතව විෂයයන් 03 කින් සමත්වීම ( නව නිර්දේශය) / සමුපකාර උසස්පෙළ සමත්වීම.

හෝ

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වීම.

(සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.)

**සභාපති,**

**සී/ස ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය,**

**ගිනිගත්හේන.**

**දු.ක. 051-2242233 / 051-2242119**